# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2064/60 - 2018 අප්‍රේල් මස 01 වැනි ඉරිදා - 2018.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

පළමුවන උපලේඛනයෙහි (10) වන අයිතමය යටතේ නියෝග

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි පළමුවන උපලේඛනයෙහි 10 වන ඡේදයෙහි (1) වන උපඡේදයෙහි (අ) අයිතමය සමග කියවිය යුතු 83 වගන්තියෙහි (1) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් දිසානායක මුදියන්සේලාගේ ලලිත් අයිවන් දිසානායක වන මවිසින්, මෙම නිවේදනය මගින් යම් සේවා නියුක්තයෙකු වෙත සිදු කරනු ලබන ගෙවීම් වලින්, බද්ද රඳවාගනු ලැබිය යුතු අවස්ථානුගත කරුණු සහ එම ගෙවීම් වලින් රඳවාගනු ලැබිය යුතු බදු අනුප්‍රමාණයන් නිශ්චිතව දක්වනු ලැබේ.

ඩී. එම්. එල්. අයි. දිසානායක,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2018 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ 02,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දී ය.

**නියෝග**

***සේවා යෝජකයන් විසින් රඳවාගැනීම***

1. **ලුහුඬු නාමය සහ ආරම්භය**
   මෙම නියෝග 2018 සේවායෝජකයන් විසින් රඳවා ගැනීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2017 අංක 24 දරන පනත (මින්මතු පනත යනුවෙන් හඳුන්වනු ලබන) ක්‍රියාත්මක වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය. (2018 අප්‍රේල් 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි)

2. **සේවායෝජකයන් විසින් රඳවාගනු ලැබිය යුතු මුදල් ප්‍රමාණ**
   යම් තක්සේරු වර්ෂයක් තුළ, සේවා යෝජකයකු විසින් සේවා නියුක්තයකුගේ සේවා නියුක්තිය වෙනුවෙන් සිදු කරනු ලබන එම ගෙවීම් වලින්, පහත තත්ත්වයන්ට අනුකූලව අදාළ මුදල් ප්‍රමාණයන් රඳවා ගනු ලැබිය යුතු ය.

   (අ) ගෙවීම එක් සේවා යෝජකයෙකු යටතේ වන සේවා නියුක්තියකින් ලැබෙන නිත්‍ය ලාභවලින් සමන්විත වන විට සහ සේවා නියුක්තිකයා විසින් ප්‍රාථමික සේවා නියුක්ති ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති විට,
   **01 වන බදු චක්‍රය අදාළ කර ගත යුතු ය ;**

   (ආ) ගෙවීම එකවර ගෙවීම්වලින් සමන්විත වන විට,
   **02 වන බදු චක්‍රය අදාළ කර ගත යුතු ය ;**

   (ඇ) ගෙවීම එක් වතාවක් පමණක් කරන ගෙවීම්වලින් (ආන්තික ප්‍රතිලාභ) සමන්විත වන විට,
   **03 වන බදු චක්‍රය අදාළ කර ගත යුතු ය ;**

1A - PG 4003 — 457 (2018/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) ගෙවීම ශ්‍රී ලංකාවේ පුරවැසි නොවන සේවා නියුක්තිකයන් විසින් ලබාගන්නා විට
**04 වන බදු වක්‍රය අදාළ කර ගත යුතු ය ;**

(ඉ) සේවා නියුක්තයෙකුගේ, ප්‍රාථමික සේවා නියුක්තියෙන් ලැබෙන මාසික නිත්‍ය ලාභ රු. 100,000 ට වඩා අඩු වන නමුත් ඇතැම් මාසවල ඉහල පාරිශ්‍රමික ගෙවීම හේතුවෙන් තක්සේරු වර්ෂයේ යම් මාසයක් දක්වා ප්‍රාථමික සේවා නියුක්තියෙන් ලැබෙන සමුච්චිත ලාභ රු. 1,200,000 ඉක්මවන විට එබඳු අවස්ථාවලදී,
**05 වන බදු වක්‍රය අදාළ කර ගත යුතු ය ;**

(ඊ) ගෙවීම සේවා යෝජකයා විසින් සේවා නියුක්තිකයා වෙත ඔහුගේ බදු බැඳියාව වෙනුවෙන් කරනු ලබන ගෙවීමකින් හෝ ප්‍රතිපූර්ණයකින් සමන්විත වන අවස්ථාවලදී,
**06 වන බදු වක්‍රය අදාළ කර ගත යුතු ය ;**

(උ) ගෙවීම ප්‍රාථමික සේවා නියුක්ති සහතිකය සපයා නොමැති යම් සමාගමක සභාපතිවරයෙකු හෝ අධ්‍යක්ෂ වරයෙකු හෝ විධායක නොවන අධ්‍යක්ෂ වරයෙකු වෙත හෝ එක් සේවායෝජකයෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් යටතේ සේවයෙහි නිරත යම් සේවා නියුක්තයෙකු වෙත හෝ සේවා නියුක්තියෙකු එක් සේවා නියුක්තියකට වඩා වැඩි සංඛ්‍යාවක් නිරතව සිටින විට, ප්‍රාථමික සේවා නියුක්තියේ සේවා යෝජකයා හැර, වෙනත් යම් සේවා යෝජකයකු විසින් ගෙවනු ලබන අවස්ථාවලදී,
**07 වන බදු වක්‍රය අදාළ කර ගත යුතු ය.**

www.ird.gov.lk යන දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් ද්වාරයෙන් බදු වක්‍ර ලබා ගත හැක.

**3. ප්‍රාථමික සේවා නියුක්තිය**

i. තක්සේරු වර්ෂයක් සඳහා සේවා නියුක්තයෙකුගේ ප්‍රාථමික සේවා නියුක්තිය යනු එම තක්සේරු වර්ෂය සඳහා සේවා නියුක්තිකයා විසින් සේවා යෝජකයෙකු වෙත (ii) අයිතමය යටතේ සපයා තිබෙන ප්‍රකාශනයට අදාළ වන සේවා නියුක්තිය වේ.

ii. එක් සේවා නියුක්තියක් පමණක් හිමි සේවා නියුක්තියකු හැර අන් සේවා නියුක්තයකු විසින් එම සේවා නියුක්තිය, ඔහුගේ ප්‍රාථමික සේවා නියුක්තිය ලෙස නම් කරමින් ප්‍රකාශයක් සේවා යෝජකයා වෙත ලබා දිය යුතුයි.

iii. අයිතම (ii) යටතේ වන ප්‍රකාශනයක් සේවා නියුක්තිකයා සහ සේවා යෝජකයා විසින් අත්සන් කර දාතම යොදා තිබිය යුතු අතර තක්සේරු වර්ෂ එකකට හෝ වැඩි සංඛ්‍යාවකට අදාළ විය හැක.

iv. යම් එක් අවස්ථාවකදී සේවා නියුක්තයෙකු සතුව, එක් ප්‍රාථමික සේවා නියුක්තියකට වඩා වැඩි සංඛ්‍යාවක් නොතිබිය යුතු ය.

v. 4 වන ඡේදයට යටත්ව, තක්සේරු වර්ෂයක් අවසානයේදී පමණක් අයිතමය (ii) යටතේ වන ප්‍රකාශනයක් සේවා නියුක්තයෙකුට ඉවත් කර ගත හැක.

**4. අනුගාමී ප්‍රාථමික සේවා නියුක්තිය**

i. යම් තක්සේරු වර්ෂයක් තුළදී සේවා නියුක්තිකයෙකු තම ප්‍රාථමික සේවා නියුක්තිය අවසන් කරන්නේ නම් සහ එම ප්‍රාථමික සේවා නියුක්තියෙන් පසුව වෙනත් සේවා නියුක්තියක නිරත වන්නේ නම් එම අනෙක් සේවා යෝජකයා වෙත පහත ලිපිලේඛණ සැපයිය යුතු ය.

(අ) 3 ඡේදයෙහි (ii) අයිතමය යටතේ වන ප්‍රකාශයක් ; සහ
(ආ) පූර්ව ප්‍රාථමික සේවා නියුක්තියට අදාළව 7 වන ඡේදය යටතේ නිකුත් කරන ලද රඳවාගැනීමේ බදු සහතිකය.

ii. (i) වන අයිතමය යටතේ රඳවාගැනීමේ බදු සහතිකයක් සපයනු ලැබූ සේවා යෝජකයකු විසින් දින 7 ක් ඇතුළත එම සහතිකය සේවා නියුක්තිකයා වෙත නැවත භාර දිය යුතු ය.

iii. (i) වන අයිතමය අදාළ වන විට, නව ප්‍රාථමික, සේවා යෝජකයා විසින් තක්සේරු වර්ෂයේ ඉතිරි කාලය තුළ සේවා නියුක්තිකයා වෙත සිදු කළ යුතු ගෙවීම් වලින් 2 ඡේදය යටතේ රඳවාගත යුතු බද්ද ගණනය කිරීමේ කාර්යය සඳහා

(අ) වර්ෂය සඳහා නව ප්‍රාථමික සේවා නියුක්තියෙන් ලැබෙන ගෙවීම් වලට රඳවාගැනීමේ බදු සහතිකයේ සඳහන් වන සේවා නියුක්තිකයාගේ පූර්ව ප්‍රාථමික සේවා නියුක්තියෙන් ලැබූ ගෙවීම් එකතු කළ යුතු ය ; සහ

(ආ) සේවා නියුක්තිකයා වෙත සිදු කරනු ලබන ගෙවීම් වලින් වර්ෂය තුළදී නව ප්‍රාථමික සේවා යෝජකයා විසින් රඳවා ගත යුතු ලෙස සැලකෙන බද්දට, සේවා නියුක්තිකයාගේ පූර්ව ප්‍රාථමික සේවා යෝජකයා විසින් රඳවාගනු ලැබූ ලෙස රඳවාගැනීමේ බදු සහතිකයේ සඳහන් වී ඇති බදු ප්‍රමාණය එකතු කළ යුතු ය.

iv. සේවා නියුක්තයෙකු විසින් තක්සේරු වර්ෂයක් තුළ ප්‍රාථමික සේවා නියුක්තීන් දෙකක් හෝ වැඩි සංඛ්‍යාවක් අවසන් කරනු ලබන අවස්ථාවකදී,-

(අ) සේවා නියුක්තිකයා විසින් (i) අයිතමය යටතේ එම රඳවාගැනීමේ බදු සහතික නව සේවා යෝජකයා වෙත සපයනු ලැබිය හැක ; සහ

(ආ) (iii) වන අයිතමය එම රඳවාගැනීමේ බදු සහතික පත්‍ර සඳහා අදාළ වේ.

5. **ද්වීතියික සේවා නියුක්තිය**
සේවා නියුක්තයෙකුට අදාළව ද්විතියික සේවා නියුක්තිය යනුවෙන් අදහස් වනුයේ එම සේවා නියුක්තිකයාගේ ප්‍රාථමික සේවා නියුක්තිය නොවන ඕනෑම සේවා නියුක්තියකි.

6. **සේවා යෝජකයාගේ වාර්ෂික ප්‍රකාශනය**
1. සේවා යෝජකයකු විසින් සකස් කර කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ප්‍රකාශනය පහත විස්තර වන පරිදි නියමිත ආකෘති පත්‍රයෙන් සමන්විත යුතු ය.

i. වර්ෂය තුළදී සේවා යෝජකයා විසින් සේවයෙහි යොදවා ඇති එක් එක් සේවා නියුක්තිකයාගේ නම, සේවා අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය ;

ii. එක් එක් සේවා නියුක්තියට අදාළව සේවා යෝජකයා ප්‍රාථමික සේවා යෝජකයාද, ද්වීතියික සේවා යෝජකයාද යන වග ;

iii. එක් එක් සේවා නියුක්තිකයාට අදාළව වර්ෂය තුළදී සේවා යෝජකයා විසින් සිදු කරන ලද ගෙවීම් ;

iv. ගෙවීම්වලින් රඳවාගනු ලැබූ මුදල් ප්‍රමාණය.

2. නිත්‍ය සේවා නියුක්ති ලාභ, එකවර ගෙවීම් සහ අනෙකුත් ගෙවීම් සම්බන්ධ විස්තර කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන උපලේඛන මගින් සැපයිය යුතු ය.

3. එම උපලේඛනයෙහි සඳහන් අයිතම සංඛ්‍යාව 20 ට වඩා වැඩිවන අවස්ථාවලදී ඊ-සේවාව භාවිතකර හෝ මෘදු පිටපත් ආකාරයෙන් ඉදිරිපත් කළ යුතු අතර එම අයිතම සංඛ්‍යාව 20 ට අඩුවන අවස්ථාවලදී ඊ-සේවාව හෝ දෘඩ පිටපත් ආකාරයෙන් ඉදිරිපත් කළ යුතු ය.

7. **සේවා නියුක්තිකයාගේ රඳවාගැනීමේ බදු සහතික**
පනතෙහි 87 වන වගන්තිය යටතේ සේවා නියුක්තයෙකු පිළිබඳව සේවා යෝජකයෙකු විසින් සකස්කර බාරදෙනු ලබන රඳවාගැනීමේ බදු සහතිකයක් පහත විස්තර වන පරිදි නියමිත ආකෘති පත්‍රයෙන් සමන්විත විය යුතු ය.

i. සේවා නියුක්තිකයාගේ නම, සේවා අංකය සහ ජාතික හැඳුනුම්පත් අංකය ;

ii. සේවා නියුක්තිකයාට අදාළව සේවා නියුක්තිය ප්‍රාථමික සේවා නියුක්තියද ද්විතියික සේවා නියුක්තියද යන වග ;

iii. තක්සේරු වර්ෂය තුළදී සේවා නියුක්තිකයා වෙත සේවා නියුක්තියෙන් ලැබුනු ගෙවීම් ප්‍රමාණය ; සහ

iv. ගෙවීම්වලින් රඳවාගනු ලැබූ බදු මුදල් ප්‍රමාණය.

8. **අසත්‍ය හෝ නොමග යවන සුළු ප්‍රකාශ**
පනතෙහි 181 වන වගන්තියෙහි කාර්යය සඳහා, සේවා නියුක්තිකයෙකු විසින් සේවා යෝජකයෙකු වෙත හෝ සේවා යෝජකයෙකු විසින් සේවා නියුක්තිකයෙකු වෙත මෙම නියෝග යටතේ සපයන ලද ප්‍රකාශනයක්, ප්‍රකාශයක් හෝ සහතිකයක්, බදු නිලධරයෙකු වෙත සිදු කරන ලද ප්‍රකාශයක් ලෙස සැලකේ.

9. **සේවායෝජකයන් නිසි වාර්තා පවත්වාගෙන යාම**
යම් නිශ්චිත සේවා නියුක්තිකයෙකු වෙත යම් පාරිශ්‍රමික ගෙවීමක් සිදු කරන සෑම සේවා යෝජකයෙකු විසින්ම,

(අ) වැටුප්පතට අනුකූලව ගෙවනු ලැබූ පාරිශ්‍රමික පිළිබඳ වාර්තා පවත්වා ගත යුතු ය ;

(ආ) සියලු සේවා නියුක්තිකයන්ගේ ප්‍රකාශන, වැටුප් පත්, සේවා නියුක්තිකයන් වෙත පාරිශ්‍රමික ගෙවීමේ ලදුපත් සහ සේවා නියුක්තිකයන්ගේ පාරිශ්‍රමික සහ කොමසාරිස් ජනරාල්වරයා වෙත සිදු කරනු ලැබූ ආදායම් බදු අඩුකිරීම් සහ ගෙවීම් වලට අදාළ වෙනත් සියලු ගිණුම් වාර්තා ආරක්ෂිතව පවත්වා ගැනීම සඳහා සියලු සාධාරණ පූර්වෝපායයන් අනුගමනය කළ යුතු ය ;

(ඇ) එම සියලු වාර්තා අදාළ වන තක්සේරු වර්ෂය අවසන් වීමෙන් අනතුරුව වසර පහකට නොඅඩු කාල පරිච්ඡේදයක් සඳහා පවත්වා ගත යුතු ය ;

(ඈ) (අ) හෝ (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් ඔහු විසින් පවත්වාගෙන යනු ලබන යම් වාර්තාවක් පරීක්ෂා කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් ලිඛිතව බලය පවරන ලද යම් නිලධාරියෙකු වෙත අවසර ලබාදිය යුතු ය.

05 - 53

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.